නාමය රන් අකුරින් සටහන් වන අතර මොලියෙර්ගේ "මුදලාලිගේ පෙරළිය" නම් නාට්‍යයෙන් නාට්‍ය දිවිය ඇරඹූ මෙතුමා කපුවා කපෝති, හැංගිහොරා, වෙද හටන වැනි නාට්‍ය මුල් කාලයේ නිර්මාණය කරන ලදී. ප්‍රථම සිවතන්ත්‍ර නාට්‍යය වශයෙන් පැරණි කථා පුවතකට නව අර්ථකතනයක් සපයමින් ඔහු නිර්මාණය කරන ලද පබාවතී නාට්‍ය දැවැන්ත දෘශ්‍යකාව්‍ය ගමන් මගක ආරම්භක සන්දිස්ථානයක් සනිටුහන් කරන ලදී.

නාට්‍යකරුවා දෘශ්‍යකාව්‍ය කරුවෙකි. වචනයේ පරිසමාප්තියෙන්ම එදිරිවීර සරච්චන්ද්‍රයන් ඊට අරුත් සපයයි පෙරදිග විචාරකයන් නාට්‍ය කලාව හැඳින්වීමේදී දෘශ්‍යකාව්‍ය රූපක යන වචන භාවිතා කෙරේ. එනම් බැලීමට ඇති කලාව යන්නයි එය නෙත් සිත් කන් වශීකරන අපූර්වත්වයෙන් යුතු නාට්‍ය නිර්මාණයක් විය යුතුයි. අන් මාධ්‍ය හා සැසඳීමේදී වේදිකා නාට්‍ය මාධ්‍ය සුවිශේෂී වෙනස්කම් රැසකින් යුක්ත වේ. අතිශය දුෂ්කර සීමාවන් තුළ ක්‍රියකිරීමට නාට්‍යකරුවාට සිදුවේ. එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය කෘති දෙස බැලීමේදි පෙළ කියවා වුව රසවිඳිය හැක. රම්‍ය වූ වාග් විලාශයන් භාවිතා කරමින් ප්‍රබල අරුත් සපයමින් සුගම වු භාෂාවක් යොදා ගනිමින් ප්‍රකාශනාත්මක බවින් ඔහුගේ දෘෂ්ටිය මනාව දෘශ්‍යකාව්‍යමය ලක්‍ෂණ ඇති වන පරිද්දෙන් නිර්මාණය කර ඇත . ඒ අනුව සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය සතු දෘශ්‍යකාව්‍යකරණයේ ප්‍රබලත්වය කෙසේද යත් අද්‍යතනයේ පවා විද්වතුන් මවිතයට පත් කරන්නා වූ ලක්ෂණයන්ගෙන් අනූන වේ. ඒ අනුව සිංහල නාට්‍ය කලාවේ මහා වංශයක් ගොඩ නැංවූ මහා ගාන්ධර්වයානන් ලෙස හඳුන්වන එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ප්‍රබල ගීත හා ගීතාංග නාට්‍ය කිහිපයක් අධ්‍යනය කරමින් ඒ තුළ වූ දෘශ්‍යකාව්‍යමය ලක්‍ෂණ පිළිබඳව අධ්‍යනය කිරීම මෙම නිබන්ධනය තුළින් අපේක්‍ෂා කෙරේ.